

2022

කාර්යය සාධන වාර්තාව

රජයේ කර්මාන්තශාලා
දෙපාර්තමේන්තුව

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 310

අන්තර්ගතය **පිටු අංක**


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය		02
1.1.	හැඳින්වීම	02
1.2	දෙපාර්තමේන්තුවේ දැක්ම,මෙහෙවර,අරමුණු	04
1.3	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්	05
1.4	තත්කාලීනව කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන කාර්යයන් හා ලබා දෙනු ලබන සේවාවන්	06
1.5	අප දෙපාර්තමේන්තුවේ සතුටුදායක සේවාලාභීන්	07
1.6	දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය	08
1.7	2021 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය හා විශේෂ සේවාවන්	09
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම		13
පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය		14
3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	14
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	15
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	16
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	17
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	25
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය	25
3.7	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	26
3.8	විගණකාධිපතිවරයාගේ වාර්තාව	27
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක		43
4.1	දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	43
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය		43
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	43
5.2	තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	43
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ		44
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	44
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය / අතිරික්තයේ බලපෑම	44
6.3	ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වූ ආකාරය	45
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව		47
7.1	අභ්‍යන්තර විගණක වාර්තාව	55

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තුවක් වශයෙන් 1849 වර්ෂයේ කොළඹ ගෑස් වීදියේ ආරම්භ කරන ලද රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පසු කාලීනව එනම් 1928 වර්ෂයේ සිට කොලොන්නාව දෙමටගොඩ මාර්ගයේ ඛණිජ තෙල් සංකීර්ණය අසල පිහිටුවා ඇත.

ආරම්භක කාල සීමාවේදී මහා මාර්ග, පාලම්, වාරි මාර්ග, ගොඩනැගිලි ඉදිකිරීම් යනාදී යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායක වී ඇති අතර විදේශීය ඉංජිනේරුවන් විසින් මෙම ආයතනය මෙහෙයවා ඇත.




1969 දක්වා මෙලෙස ක්‍රියාත්මක වූ රජයේ වැඩ දෙපාර්තමේන්තුව එමගින් ඉටු කළ මහා මාර්ග තැනීම, නඩත්තුව, සහ ගොඩනැගිලි ඉදි කිරීම සහ නඩත්තුව යනාදී සිවිල් ඉංජිනේරුමය කාර්යයන් සඳහා මහා මාර්ග දෙපාර්තමේන්තුව හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවද, යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම සඳහා "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ද, 1971.01.10 දින ස්ථාපනය කර ඇත.



බොල්ගොඩ පාලම ඉදිරිපස පෙනුම
1938 ජනවාරි 20

එතැන් සිට විවිධ රජයේ ආයතන මෙහෙයවීම සඳහා අවශ්‍ය වූ යාන්ත්‍රික ඉංජිනේරුමය සහායක සේවාවන් සැපයීම සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ අත්තිකාරම් ගිණුම් ක්‍රමයක් යටතේ පවත්වාගෙන යනු ලැබේ.



කාලානුරූපීව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් හා පොදු පහසුකම් අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ වර්තමානයේ **නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය** යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.

මේ වන විට ශ්‍රී ලංකාව තුළ ජල කලමනාකරණ දියදොරටු නිර්මාණය කර, සවි කිරීමේ වෙළඳපොලෙහි ප්‍රමුඛස්ථානය, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත හිමිව තිබේ. මෑතකදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නිම කරන ලද බොහෝ මහා පරිමාණ ජල ව්‍යාපෘතිවල ජල පාලන දියදොරටු සියල්ලම නිර්මාණය කර සවි කරන ලද්දේ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසිනි. වෙහෙරගල, දැදුරු ඔය, පේ ආරු, රාජාංගනය, තොණ්ඩමනාරු, අට්ටික්කාව සහ රඹකැන් ඔය ජලාශ ව්‍යාපෘතීන් මින් කිහිපයකි.

ඊට අමතරව පානීය ජලය ලබාදීම වෙනුවෙන් පිරිපහදු ටැංකි නිර්මාණය කර සවිකිරීම සිදු කරන ලදි.

රජයේ කර්මාන්තශාලාව විසින් යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ කරනු ලබන නිෂ්පාදන සහ සේවා ඉටු කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ කළ වැඩ අත්තිකාරම් සහ ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය යටතේ වන බැවින් මෙම දෙපාර්තමේන්තුව රාජ්‍ය අංශයේ වාණිජ කටයුතු මෙහෙයවන සුවිශේෂී දෙපාර්තමේනතුවක් වශයෙන් හැඳින්විය හැක.

නිෂ්පාදන සහ නඩත්තු කාර්යයන් සඳහා යොදවනු ලබන දෙපාර්තමේන්තුගත නිලධාරීන්ට සහ සේවක පිරිස් සඳහා වැටුප් ගෙවීමට මාසිකව රුපියල් මිලියන 24ක මුදලක් පාරිභෝගිකයින්ගෙන් උපයා ගත යුතු වේ. මේ සඳහා මහා භාණ්ඩාගාරය විසින් අරමුදල් සපයනු නොලැබේ.

ශ්‍රී ලංකා ජාතික තත්ව ප්‍රතිපත්තිය අනුව යමින් 2013 වර්ෂයේදී රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ISO 9001:2008 ජාත්‍යන්තර තත්ත්ව පද්ධති සහතිකය දිනා ගැනීමට සමත් විය. මෙම සහතිකය උපයා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග තුලින් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට හැකි වූ අතර 2022 වසර සඳහා , ISO 9001:2015 ජාත්‍යන්තර තත්ත්ව පද්ධති සහතිකය යාවත්කාලීන කරන ලදී. මේ මගින් අප විසින් ඉටු කරන පාරිභෝගික සේවා වල වර්ධනයක්ද ඇති කිරීමට හැකියාව ලැබී ඇත.



තෝප්පුව පාලම
1938 ඔක්තෝම්බර් 24



මාලිගාවිල බුදු පිළිමයට වහල සැකසීම

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

නිරසාර සංවර්ධනය තුලින්, ශ්‍රී ලාංකීය යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ නිෂ්පාදන, සේවා සහ පුහුණුව සපයන විශිෂ්ඨතම රාජ්‍ය ආයතනය බවට පත්වීම.

මෙහෙවර

“රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත, යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වැඩ, නිෂ්පාදන, සේවා සහ උපදේශන සේවා සැපයීම. තාක්ෂණික ඉංජිනේරු ආධුනිකයින්, වෘත්තීය ඉංජිනේරුවරුන් වෙත, යාන්ත්‍රික වැඩ හා සේවා සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබා දීම.”

1.3 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

(අ) නිෂ්පාදන ක්ෂේත්‍රය

රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් සඳහා ලෝහමය, දැවමය භාණ්ඩ නිර්මානය හා නිෂ්පාදනය

1. වාරිමාර්ග ජල කළමනාකරණ දිය දොරටු හා උපකරණ, ආරෝග්‍යශාලා උපකරණ
2. දැව ගෘහ භාණ්ඩ දැව භාණ්ඩ
3. චීනච්චට්ටි, හා නිෙරස් වාත්තු
4. පොලිස් දෙපාර්තමේන්තුව සඳහා නිල පටි, තරු, අංක තහඩු නිෂ්පාදනය කිරීම
5. තැපැල් දෙපාර්තමේන්තුව හා වෙනත් දෙපාර්තමේන්තු සඳහා දින මුද්‍රා හා ඒ සඳහා අවශ්‍ය වන කැට නිෂ්පාදනය
6. නාම පුවරු

(ආ) ඉදිකිරීම් ක්ෂේත්‍රය (බර වැද්දුම්)

1. වාරිමාර්ග ජලාශ සඳහා විවිධ වර්ග වල ජල පාලන දිය දොරටු නිර්මාණය, නිෂ්පාදනය සහ සවි කිරීම
2. පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති විහාරස්ථාන සහ බුද්ධ ප්‍රතිමා සඳහා ආරක්ෂක වැටවල් සහ ආරක්ෂිත වහල ඉදිකිරීම
3. යකඩ සැකිළි මත ඉදි වූ ගොඩනැගිලි සෑදීම.
4. ගොඩනැගිලිවල දැව සහ ලෝහමය වහල ඉදි කිරීම
5. රාජ්‍ය උත්සව, දේශිය හා විදේශිය රාජ්‍ය නායකයින්, විශේෂ ආරාධිත අමුත්තන් පිළිගන්නා උත්සව සඳහා හිරු ආවරණ, වේදිකා, කුටි ඉදි කිරීම
6. යකඩ පාලම් ඉදිකිරීම
7. ජල පවිත්‍රාගාර ටැංකිනිර්මාණය හා සවිකිරීම

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

(ඇ) අලුත්වැඩියා සහ නඩත්තු ක්ෂේත්‍රය

1. ආරෝග්‍යශාලා, ආයුර්වේද, රෝහල්, බන්ධනාගාර, ලුහු කර්මාන්ත ආදී ආයතනවල යන්ත්‍රෝපකරණ නඩත්තුව හා අලුත්වැඩියාව
2. වාරිමාර්ග හා ගොවිජනසේවා දෙපාර්තමේන්තු වල හා අනෙකුත් ආයතනවල ජල කළමනාකරණ දිය දොරටු සහ උපාංග නඩත්තුව හා අලුත්වැඩියාව
3. කාර්යාල වල දැව භාණ්ඩ නඩත්තුව හා අලුත්වැඩියාව.
4. යතුරු ලියන හා වායු සමීකරණ යන්ත්‍ර නඩත්තුව හා අලුත්වැඩියාව
5. රාජ්‍ය ආයතනවල වාහන සේවා කිරීම

(ඈ) යාන්ත්‍රික ඉංජිනේරු උපදේශාත්මක සේවා

1. පශ්චාත් ඉංජිනේරු හා ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්, විවිධ පුහුණු ආයතනවල ආධුනිකයින් සඳහා ආයතනික ප්‍රායෝගික පුහුණුව ලබා දීම.
2. රාජ්‍ය ආයතනවල අලුත්වැඩියා කළ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා තත්ත්ව වාර්තා ලබා දීම.
3. රාජ්‍ය ආයතනවල තාක්ෂණික ඇගයීම් කමිටු, අපහරණ කමිටු හා තක්සේරු කමිටු සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
4. යාන්ත්‍රික ඉංජිනේරුමය නිෂ්පාදනය හා සේවා සහ උපදේශක සේවා සැපයීම


1.4 තත්කාලීනව කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන කාර්යයන් හා ලබා දෙනු ලබන සේවාවන්

අංකය	ආයතනය	සපයනු ලබන සේවාවන්
01.	වාරිමාර්ග දෙපාර්තමේන්තුව,	අරිය දිය දොරටු හා අනෙකුත් චීනවිවටිටි, දැව හා යකඩ ජලනල දිය දොරටු හා උපාංග නිර්මානය හා සවි කිරීම.
02.	රෝහල්	රෝහල් පවුඩර් කෝටින් කරන ලද හා සුදු යකඩින් නිෂ්පාදිත ගෘහ උපකරණ
03.	පොලිස් දෙපාර්තමේන්තුව/ ආරක්ෂක අමාත්‍යාංශය	නිල පටි, නාම පුවරු, යාන්ත්‍රික සයිරන් නලා, නිල අංක තහඩු ද්විත්ව ඇඳන්
04.	තැපැල් දෙපාර්තමේන්තුව	වර්ෂ, මාස හා දින කැට ඇතුළත් තැපැල් මුද්‍රා, ගෘහ උපකරණ, මෙවලම් නිෂ්පාදනය සහ යකඩ හා දැව ආශ්‍රිත නිමැවුම්
05.	දුම්රිය දෙපාර්තමේන්තුව	වාත්තු හා යකඩමය නිෂ්පාදනයන්
06.	පුනරුත්ථාපන/ ආයුර්වේද රෝහල්	යන්ත්‍රෝපකරණ සවි කිරීම සහ නඩත්තුව
07.	මාර්ග සංවර්ධන අධිකාරිය	මාර්ග බාධක හා සංඥා පුවරු, මෑන් හෝල් සැකිලි හා පියන්, යකඩ පාලම්
08	ජල සම්පාදන, ජල ප්‍රවාහන මණ්ඩලය	ජල පවිත්‍රාගාර ටැංකි ඉදිකිරීම / සවි කිරීම / අළුත් වැඩියාව
09.	මැනිවරණ දෙපාර්තමේන්තුව	ඡන්ද පෙට්ටි සැදීම, ගෘහ උපකරන සැපයීම
10.	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	කාමර වෙන් කිරීම්, වහල අළුත් වැඩියා, වැසි අංක හා එන්ජින් අංක මුද්‍රණය
11	සියළුම රාජ්‍ය / පෞද්ගලික ආයතන	දැවමය ගෘහ භාණ්ඩ හා අනෙකුත් දැව නිෂ්පාදිතයන්
		ස්ක්‍රීන් මුද්‍රණ, ඩිජිටල් මුද්‍රණ, දැන්වීම් පුවරු, කැටයම් වැඩ, එන්ග්‍රේව් (සැරිම)
		එම්බෝස් (ඉලිප්පුම් වැඩ) , රාජ්‍ය ලාංඡන
		දොර හා ජනෙල් නිෂ්පාදනය, බිත්ති පනේල (කැටයම්) කිරීම, පාටිෂන් කිරීම (ඇලුමිනියම් හා දැව)
		කැපීම, සිදුරු කිරීම, එතීම, හිල් විදීම (ඩ්‍රිල් කිරීම) වෑල්ඩින් සහ කම්මල් වැඩ, සියළුම යාන්ත්‍රන වැඩ Planing, CNC, Milling
		විශාල පිරිසැකසුම් වැඩ , සැහැල්ලු පිරිසැකසුම් වැඩ හා කම්මල් වැඩ හා ඇලුමිනියම් පිරිසැකසුම් වැඩ.
		විදුලි වැඩ, Control Panel Board නිර්මාණය හා සැදීම විදුලි ස්ථාපනයන් හා අලුත්වැඩියාවන්
		ඉලෙක්ට්‍රෝ ප්ලේටින් (විද්‍යුත් ලෝහාලේපනය) Powder coating කිරීම.
12.	වරලත් ඉංජිනේරු, ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්, විවිධ තාක්ෂණික පුහුණු ආයතන	යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රායෝගික පුහුණුව ලබාදීම

1.5 අප දෙපාර්තමේන්තුවේ සතුටුදායක සේවාලාභීන්

අංකය	ආයතනය	ලබා දුන් සේවාවන්
01	ක්‍රීඩා අමාත්‍යාංශය	දැවමය උළුවහු හා දොර ජනෙල් සෑදීම
02	මහා භාණ්ඩාගාරය	දැවමය උළුවහු හා දොර ජනෙල් සෑදීම
03	මැතිවරණ දෙපාර්තමේන්තුව	ඡන්ද පෙට්ටි සෑදීම, අළුත්වැඩියාව හා නාම පුවරු සැකසීම
04	ගල්ගුර් ගොඩනැගිල්ල - කොළඹ 01	දැවමය උළුවහු හා දොර ජනෙල් සෑදීම
05	ජනාධිපති මන්දිරය (අනුරාධපුර / නුවරඑළිය)	දැවමය උළුවහු දොර ජනෙල් සහ වහලය අළුත් වැඩියාව හා නඩත්තුව
06	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	ජල පාලන දිය දොරටු හා උපාංග සැලසුම් කිරීම, නිෂ්පාදනය නඩත්තුව හා අළුත්වැඩියා කිරීම.
07	රජයේ රෝහල්	සියළුම රෝහල් ගෘහ උපකරණ (යකඩ සහ සුදු යකඩ) පව්ඩර් කෝටින් කිරීම හා අළුත්වැඩියා කිරීම.
08	පොලිස් දෙපාර්තමේන්තුව	නිල පටි, අංක තහඩු ගෘහ උපකරණ (දැව හා යකඩ)
09	තැපැල් දෙපාර්තමේන්තුව	වර්ෂ, මාස හා දින කැට ඇතුළත් තැපැල් මුද්‍රා, ගෘහ උපකරණ හා මෙවලම්, නාම පුවරු නිෂ්පාදනය හා යකඩ සැකිලි මත ගොඩනැගිලි ඉදි කිරීම.
10	අධිකරණ අමාත්‍යාංශය	දැවමය ගෘහ භාණ්ඩ, ලේඛණාගාර රාක්ක, නාම පුවරු
11	පුරා විද්‍යා දෙපාර්තමේන්තුව/ මධ්‍යම සංස්කෘතික අරමුදල	පුරා වස්තූන් සඳහා යකඩ වහළ නිර්මාණය, සෑදීම, සවි කිරීම, නාම පුවරු, කෞතුකාගාර ගෘහ භාණ්ඩ නිෂපාදනය, විදි ලාම්පු කනු සඳා සවි කිරීම.
12	දුම්රිය දෙපාර්තමේන්තුව	තිරිංග පලු හා දුම්රිය සංඥා සඳහා අවශ්‍ය භාණ්ඩ / උපකරණ
13	විදේශ කටයුතු අමාත්‍යාංශය	යකඩ හා දැවමය භාණ්ඩ / උපකරණ නඩත්තු කටයුතු සිදු කිරීම හා අළුත්වැඩියා කිරීම
14	මාර්ග සංවර්ධන අධිකාරිය/ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය	යකඩ පාලම් සෑදීම සහ සවිකිරීම, නාම පුවරු සැදීම.
15	ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය	ජල පවිත්‍රාගාර ටැංකි නිර්මාණය, සෑදීම හා සවි කිරීම
16	ගුවන්තොටුපල හා ගුවන්සේවා සමාගම	Gantry පුටු Powder coart කිරීම ,වීදුරු බිත්ති ආවරණය කිරීම සඳහා ආවරණ (Fender) සවි කිරීම.

1.6 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



ජෙ.යා.අ -	ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික අධිකාරී	ප්‍ර. සැ.ශි -	ප්‍රධාන සැලසුම් ශිල්පී	ජෙ.යා.අ.සැ -	ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික අධිකාරී (සැපයුම්)
සංව. නිල -	සංවර්ධන නිලධාරී	ජෙ.යා.අ.ආ -	ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික අධිකාරී (ආරක්ෂක)	යා.අධි -	යාන්ත්‍රික අධිකාරී
කා ග.ලිපි -	කාළගණක ලිපිකරු	පා.නි -	පාලන නිලධාරී	වැඩ.පරි -	වැඩ පරිපාලක
ප්‍ර.සම්.සහ -	ප්‍රමාණ සම්ක්ෂණ සහකාර	වැඩ.ලිපි -	වැඩහල ලිපිකරු	අ.වැ ස -	අයවැය සහකාර
කළ සේ නි -	කළමණාකරණ සේවා නිලධාරී	අර්.ශිල්පී -	අර්ධ ශිල්පී	සුසා.නි -	සුභසාධක නිලධාරී
කා.කා.ස -	කාර්යාල කාර්ය සහායක	වැ.හ සහ -	වැඩහල සහකාර	තොා.ස.තානි -	තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිලධාරී

1.7 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය (2022.12.31 දිනට) - කළ වැඩ අත්තිකාරම්

	ව්‍යාපෘති විස්තර	ඉලක්කය 2022		ප්‍රගතිය 2022	
		ඇස්තමේන්තුව (රු.මි.)	භෞතික(%)	පිරිවැය (රු.මි.)	භෞතික(%)
1	උමා ඔය පහළ නිම්නය(අලි කොට ආර) සඳහා ජල පාලන ගේට්ටු සහ අරිය ගේට්ටු සාදා සවි කිරීම	12	100%	10	75%
2	ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ ඔලියමුල්ල ප්‍රදේශයේ ජල පාලන දිය දොරටු 06ක් සාදා සවිකිරීම.	67	100%	26.6	80%
3	පැකේජ් වර්ගයේ ජල පිරිපහදු ටැංකි සාදා සවි කිරීම. ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලය, හපුගල, ගාල්ල.	69	100%	34.6	96%
4	විදුලි, යාන්ත්‍රික යාන්ත්‍රන, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා නඩත්තු ඒකකය මගින් ඉටු කරන කාර්යයන්	25	100%	17.2	46%
5	බර පිරිසැකසුම් ඒකකය මඟින් ඉටු කරන අනෙකුත් කාර්යයන්.	70	100%	68.5	98%
6	යාන්ත්‍රික දැව ඉරීම සහ දැව භාණ්ඩ සෑදීමේ ඒකකය මගින් ඉටුකරන කාර්යයන්.	20	100%	10.6	50%
7	සැහැල්ලූ පිරිසැකසුම් ඒකකය මඟින් ඉටු කරන කාර්යයන්.	60	100%	118.6	95%
8	වාත්තු වැඩ ඒකකය මගින් ඉටු කරන කාර්යයන්	35	100%	16.9	48%
9	සැහැල්ලු ඉංජිනේරු වැඩ ඒකකය මගින් ඉටු කරන කාර්යයන්.	30	100%	16	62%
10	වාහන අලුත්වැඩියා ඒකකය මඟින් සිදු කරනු ලබන කාර්යයන්.	15	100%	24.2	85%
	මුළු එකතුව	**403**		**343**	

1.ඔලියමුල්ල ව්‍යාපෘතිය

ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය මගින් ඔලියමුල්ල ප්‍රදේශයේ යකඩින් සහ සුදු යකඩින් දිය දොරටු ඉදිකිරීමේ කාර්යය, කර්මාන්ත ශාලාව වෙත භාරදී ඇත. 2021 වර්ෂයේ ආරම්භ කර ඇති මෙම කාර්යයෙහි 75% ක් පමණ වැඩ අවසන් කර ඇති අතර, 2022 වර්ෂයේදී යකඩ ගේට්ටු අවසන් කරන ලද අතර සුදු යකඩ ගේට්ටු 90% ක පමාණයක කාර්යය අවසන් කරන ලදි.

2.හපුගල ජල පවිත්‍රාගාර ව්‍යාපෘතිය

ජල සම්පත් මන්ඩලය විසින් ලබා දී ඇති ජල පවිත්‍රාගාරයේ ඉදිකිරීම් කටයුතු සඳහා වන ඇණවුමෙයි 80%ක පමණ කාර්යයන් නිමා වී ඇති අතර 2022 වර්ෂයේ දී සම්පූර්ණ කාර්යය නිම කර ඇත.

3.අලිකොට ආර දිය දොරටු සඳහා හදිසි දිය දොරටු ව්‍යාපෘතිය

රජයේ තර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද අලිකොට ආර දිය දොරටු සඳහා සහ සකස් කරමින් පවතින ඔලියමුල්ල දිය දොරටු සඳහා හදිසි දිය දොරටු සැකසීමේ කාර්යය 2021 වර්ෂයේ ඉටු කිරීමට ලැබී තිබුනි. ඔලියමුල්ල සඳහා රුපියල් මිලියන 38ක් හා අලිකොට ආර සඳහා රුපියල් මිලියන 8ක් මේ සඳහා ඇස්තමේන්තු කර ඇත.2022 වර්ෂයේදී 85% ක කාර්යයන් අවසන් කර ඇත.

විශේෂ සේවාවන්

- ජාතික නිදහස් දින උළෙලේ ආචාර පිටිකාව හා විශේෂ අමුත්තන් සඳහා වන වැසි ආවරණ කුටි සැකසීම.
- පොලිස් දෙපාර්තමේන්තුව සඳහා ඇඳන් 1850 ක් සාදා නිම කර ඇත. (මෙට්ට 3700 ක් සඳහා)
- සෞභග්‍ය දැක්ම වැඩසටහනට සමගාමීව කාබනික පොහොර සැකසීම සඳහා බහුකාර්ය කැබලි කිරීමේ යන්ත්‍ර (Engine Driven Chopping Machine) 48ක් නිපදවීම.
- CNC යන්ත්‍ර භාවිතයෙන් පෞද්ගලික ආයතන සඳහා Mould සැකසීම.
- කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කව්පිඇට වෙන්කිරීමේ මැෂින් 30 ක් සැදීම.
- පාතේහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා Calandering Machine නිෂ්පාදනය .



තොන්ඩමනාරු බරාජයේ ජල පාලන දිය දොරටු



ඔලියමුල්ල ගේට්ටුව සෑදීම



රාජාංගනය ජලාශයේ වාන් දොරටු ප්‍රතිසංස්කරණය



දැදුරු ඔය ව්‍යාපෘතියේ ගේට්ටු එසවුම් පද්ධතිය



අලිකොට ආර ව්‍යාපෘතියේ ගේට්ටු එසවුම් පද්ධතිය



කංගනිකුලම් ප්‍රතිසංස්තරණය



කොම්පෝස්ට් පොහොර කැබලිකිරීමේයන්ත්‍රය



දැදුරු ඔය ව්‍යාපෘති හදිසි ජල පාලන දොරටු



හපුගල ජල පිරිපහදු ඒකකය



රාජ්‍ය ලාංඡනය



ගල් අමුණ ව්‍යාපෘතියේ ජල පාලන දොරටු



වාත්තු නිෂ්පාදන



කඩදාසි පදම් කරන යන්ත්‍රය(Calendarine Machine)



හුමාල ජනක යන්ත්‍රය



පුළුගුනාවි ව්‍යාපෘතිය සඳහා දිය දොරටු සැකසීම



ICU BEDS

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ

* ISO 9001 – 2015 තත්ත්ව සහතිකය සහ EM1-CIDA සහතික 2022 වසරට අලුත් කර ගැනීම.
* පුද්ගලික ආයතන සමඟ තරඟකර ජල පාලන දොරටු අවම මිළගනන් යටතේ සාදා සවිකිරීමට හැකිවීම.
* ආනයනික ජල පිරිපහදු ටැංකි වෙනුවට දේශීයව සුදු යකඩ භාවිතා කර අවම පිරි වැයකින් ජල පිරිපහදු ටැංකි නිර්මාණය කර තනා සවිකිරීමට හැකිවීම .
* පාරම්පරික නිශ්පාදන යන්ත්‍ර වෙනුවට නවීන තාක්ෂණය සහිත යන්ත්‍ර සූත්‍ර මිලදීගෙන කාර්යක්ෂම හා උසස් ප්‍රමිතියෙන් යුත් ද්‍රව්‍ය සැකසීමට කටයුතු කිරීම.

අභියෝග

* යාන්ත්‍රික ඉංජිනේරුමය නිෂ්පාදන සහ සේවාවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සහ උපාංග වෙළඳපොල තුළ බහුලව නොතිබීම නිසා නිෂ්පාදනය කර ලබා ගැනීමට සිදු වීම හා බොහෝ විට විදේශයන් මගින් ආනයනය කර සපයා ගැනීමට සිදු වීම. එබැවින් උපාංග සහ අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ප්‍රමාදයන් සිදු වීම හා සමහර උපාංග ප්‍රායෝගිකව සැලසුම් කර ඇණවුම් කිරීමට නොහැකි වීම නිසාත් සිදු වන ප්‍රමාදයන් (සමහර අවස්ථාවලදී සාම්පල් ඉදිරිපත් කිරීමට සිදු වේ.)
* තාක්ෂණික හා කාර්යාලීය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු දිගින් දිගටම පැවතීම හා කලට වේලාවට පිරවීමේ යන්ත්‍රණයක් නොතිබීම.
* නව තාක්ෂණය සහිත යන්ත්‍රසූත්‍ර ලබා ගැනීම තුලින් කාර්යක්ෂමතාවය හා නිෂ්පාදනය ඉහල නැංවීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇතිමුත් ක්‍රියාත්මක නොවීම.
* ආයතනික සම්පත් සැලසුම් කිරීමේ (FMS) මෘදුකාංගයක් ස්ථාපනය කර පරිපාලන කාර්යයන් කාර්යක්ෂම කිරීම.
* යාන්ත්‍රික ඉංජිනේරු ඉදිකිරීම් සේවා සහ නිෂ්පාදන සඳහා වෙළඳපොල ප්‍රමිතියක් නොමැති වීම හා මේ පිළිබඳව සොයා බැලීමට නියාමන ආයතන නොමැති වීම.
* සම්පූර්ණ කරන ලද කාර්යයන් සඳහා රාජ්‍ය ආයතනවලින් ලැබීමට නියමිත මුදල් නියමිත කාල වකවානු තුළ නොලැබීම.
* රාජ්‍ය ප්‍රතිපත්ති මත ප්‍රසම්පාදන ක්‍රියාවලින්ට අනුගතව කටයුතු සිදුකිරීමට සිදුවීම මත පුද්ගලික ආයතන සමඟ කටයුතු සිදුකිරීමට නොහැකිවීම.
* ආනයනික අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ දී පනවා ඇති නීති මත කාර්යයන් ප්‍රමාද වීම.
* කාර්යසාධන බැඳුම්කර, ලංසු බැඳුම්කර හා වෙනත් බැඳුම්කර ඉදිරිපත් කිරීමට නොහැකි වීම.
* CSR සැපයිම සිදු කිරීමට නොහැකි වීම මත CIDA ආයතනයේ ලියාපදිංචිව වීමේදී අභිමත ගැටලු.
* 1993 වර්ෂයේ සිට PL කාණ්ඩයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අවස්ථාව සැලසී නැත. බහුකාර්ය කාර්ය සාධන බලකාය මගින් PL කාණ්ඩයේ තනතුරු සඳහා සුදුසුකම් ලත් වෘත්තිකයින් නොමැති බැවින් PL කාණ්ඩයේ පුරප්පාඩු පිරවීම ගැටලු සහගත වී ඇත.

ඉදිරි ඉලක්ක

* දැනට ඇණවුම් ලැබීම ගිලිහී ගොස් ඇති වාරි මාර්ග දෙපාර්තමේන්තු ඇණවුම්, රෝහල් ගෘහ භාණ්ඩ ඇණවුම්, පොලිස්, තැපැල් දෙපාර්තමේන්තු ඇණවුම් නැවත ලබා ගැනීමට සාකච්ඡා කිරීම.
* මහා මාර්ග සම්බන්ධ ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන මෙවලම් විදේශයන්ගෙන් ගෙන්වීමෙන් තොරව දේශීයව නිෂ්පාදනය කර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
* රාජ්‍ය ප්‍රතිපත්ති මත ප්‍රසම්පාදන ක්‍රියාවලින්ට අනුගතව කටයුතු කිරීමට සිදු වීම මත පෞද්ගලික ආයතන සමඟ තරඟකාරීව කටයුතු කිරීමට නොහැකි වීම.
* සාමාන්‍ය මහජනතාව සඳහා අවශ්‍ය යාන්ත්‍රික හා දැවමය කාර්යන්වල නිෂ්පාදන හා සේවා ලබා දීමේ ක්‍රමවේදයක් ඇති කිරීම.
* රටේ වර්ථමාන අවශ්‍යතාවයට අනුව පුහුණු ආයතනයක් ස්ථාපිත කිරීම.

පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2022 /12/31 දිනට අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

එසිප්-එන්

රු.

අයවැය 2022 රු.		සටහන	2022 කෘත්‍ය	2021	
-					
-	මුළු ආදායම් ලැබීම් (අ)	1	0	0	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	0	0	එසිප්-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	0	0	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	0	0	
-	මුළු ආදායම් ලැබීම් (අ)		0	0	
-	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අයිතම		214,046,000	570,453,873	එසිප්-3
-	නැන්පතු		41,672,150	71,415,394	එසිප්-4
-	අන්තිකාරම් ගිණුම්		740,447,137	691,647,795	එසිප්-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		0	45,339,498	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		996,165,288	1,378,856,559	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		996,165,288	1,378,856,559	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		16,895,043	323,443,439	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ= (ඇ)-(ඇ)		979,270,244	1,055,413,120	
	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
100,000,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	98,401,331	97,612,673	
25,550,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	23,190,801	42,433,575	එසිප්-2(ii)
930,000.00	යහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	715,616	867,285	
-	පොළී ගෙවීම්	8	0	0	
23,150,000.00	වෙනත් පුනරාවර්තන වියදම්	9	21,402,480	61,162	
149,630,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		143,710,227	140,974,696	
	මූලධන වියදම්				
42,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	23,436,523	37,140,824	
8,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	7,335,911	49,498,349	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	0	61,006,633	එසිප්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	0	0	
300,000	තැකියා වර්ධනය	14	300,000	1,736,153	
500,000	වෙනත් මූලධන වියදම්	15	500,000	1,000,000	
50,800,000	මුළු මූලධන වියදම් (උ)		31,572,434	150,381,959	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)				
	නැන්පතු ගෙවීම්		72,541,851	67,108,609	එසිප්-4
	අන්තිකාරම් ගෙවීම්		753,443,765	617,392,310	එසිප්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		0	0	
	මුළු ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		825,985,616	684,500,919	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,001,268,277	975,857,574	
	2022 දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(21,998,033)	79,555,546	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(21,998,033)	79,555,546	එසිප් 7
	2022 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		0	0	එසිප් 3

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-8

2022.12.31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

නනය

	සටහන	2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,007,229,627	999,893,716
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	(154,948,819)	(167,945,447)
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	0	20,894,810
මුළු වත්කම්		852,280,808	852,843,079
ශුද්ධ වත්කම් / ස්වාමිත්වය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(178,767,099)	(222,633,428)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,007,229,627	999,893,716
තුලි හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම්	ඒසිඒ- 5/5(බී)	0	0
ප්‍රංශම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	23,818,280	54,687,981
අදාම ශේෂය	ඒසිඒ-3	0	20,894,810
මුළු වගකීම්		852,280,808	852,843,079

පිටු අංක 01 සිට 38 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 39 සිට 46 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස්වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ප්‍රධාන ගණකාධිකාරි/
නම : ඩබ්. එස්. සත්‍යානන්ද	නම : ඒ. විජේසිංහ	~~අධ්‍යක්ෂ (මුදල්)~~/ ~~කොමිසාරිස් (මුදල්)~~
තනතුර : ලේකම්	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	නම : ඩබ්. ඒච්. සී. හිමාලි
දිනය : 2024/02/02	දිනය : 2023/02/22	දිනය : 2024/02/23
ඩබ්ලිව්.එස්. සත්‍යානන්ද SLAS (SPECIAL GRADE) MBA(Ballarat), PGD(La-Trobe), B.Sc (Sri Jayawardenepura) ලේකම් නාගරික සංවර්ධන හා තිවාස අමාත්‍යාංශය 17 වන මහල, "සුහුරුපාය" බත්තරමුල්ල	ඉංජි. ඒ. විජේසිංහ අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව කොලොන්නාව	ඩබ්ලිව්.එච්.සී. හිමාලි ප්‍රධාන ගණකාධිකාරි ග.ප.ග.සේ

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව


ඒසිඑ-සී

රුපියල්

	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය බදු ලැබීම්		
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ ගාලුපත		
ලාභ		
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	68,849,133 ✓	
අලුත් ලැබීම්	214,046,000 ✓	570,453,873
අත්තිකාරම් අයකර ගැනීම්	740,871,944 ✓	692,275,618
තැන්පතු ලැබීම්	41,672,150 ✓	71,415,394
අනෙකුත් ප්‍රධාන ලෙජර් සඳහා ලැබීම්	0	45,339,498
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	1,065,439,227	1,379,484,382
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුදුගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	142,264,557 ✓	139,789,569
සමගාමීකර සහ පිරුනිරීම්	715,616 ✓	968,617
වේතන් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	48,356,527 ✓	80,359,873
භාණ්ඩාගාරයට පියවන ලද අලුත්	16,895,043 ✓	323,443,439
අත්තිකාරම් ගෙවීම්	753,093,199 ✓	617,432,316
තැන්පතු ගෙවීම්	72,541,851 ✓	67,108,609
අනෙකුත් ප්‍රධාන ලෙජර් සඳහා ගෙවීම්	0	0
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	1,033,866,793	1,229,102,423
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	31,572,434 ✓	150,381,959
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	0	0
ලාභාංශ	0	0
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	0	0
උපණය අයකර ගැනීම්	0	0
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	0	0
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	31,572,434 ✓	150,381,959
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	31,572,434	150,381,959
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(31,572,434)	(150,381,959)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	0	(0)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	0	0
විදේශීය ණය ගැනීම්	0	0
ප්‍රදානයන් ලැබීම්	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (එ)	0	0
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	0	0
විදේශීය ණය ආපසු ගෙවීම්	0	0
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඒ)	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඒ)=(එ)-(ඒ)	0	0
		0
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	0	0
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	0	27,700
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	

4

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්



ඇමුණුම-(ii)

පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 310 රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය: 02, සංවර්ධන වැඩසටහන්

1 වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අභය		සිද්ධි සංඛ්‍යාව	වටිනාකම් (රු)
(i)	රු. 25,000.00 අඩු	.....	
(ii)	රු. 25,000.00 වැඩි	.....	
	එකතුව		

2 වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය

	අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය රු.	අලාභයේ වටිනාකම් රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම් සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1	PD-9102 වාහන අනතුර	අලාභයේ වටිනාකම් වටිනාකම් තක්සේරු කර නොමැත.					
2	PD-9101 වාහන අනතුර	අලාභයේ වටිනාකම් වටිනාකම් තක්සේරු කර නොමැත.					
	එකතුව						

සටහන - ඒබීඒ 4(i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් සම්බන්ධයක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

.....

~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ ප්‍රධාන ගණකාධිකාරි/
~~අධ්‍යක්ෂ (මූල්‍ය)~~ /~~ප්‍රධාන කළමනාකරු~~(මූදල්)

දිනය : 2023/04/23

ඩබ්ලිව්.එච්.සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලං.ග.සේ. 1
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
කොළඹ 10

බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

රජයේ කර්මාන්ත සැලැ දෙපාර්තමේන්තුව
මියදම් ශීර්ෂ අංකය: 310
වැඩසටහන් අංකය හා නාමය:02, සංවර්ධන වැඩසටහන්

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් අංකය	මාසය	දිනය	ශීර්ෂය	වැඩසටහන	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂයය	මූල්‍ය කරණය	අයිතමය	බැඳීම්	බැඳීම් ශේෂය	බැරකම්වලට ඇතුළත් වූ දිනය	බැරකම් වටිනාකම	බැරකම් නිදහස් කිරීම්	බැරකම් ශේෂය
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු																
	0		0	0	0	0	0	0	0				-	-		-
එකතුව																-
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල																
Lanka Electricity Company (Pvt) Ltd	13C - 01		22.12.31	310	2	1	0	1403	11				-	468,976		468,976
Lanka Electricity Company (Pvt) Ltd	13C - 02		22.11.29	310	2	1	0	1403	11				-	3,879		3,879
National Water Supply & Drainage Board	13C - 03		22.11.29	310	2	1	0	1403	11				-	3,254		3,254
National Water Supply & Drainage Board	13C - 04		23.01.02	310	20	1	0	1403	11				-	181,823		181,823
එකතුව																657,931
3. වෙනත් (පෞද්ගලික අංශය)																
Rakna Arakshaka Lanka Ltd	13C - 05		22.12.28	310	2	1	0	1409	11				2022.12.31	768.030		768.030
The Associated News Papers Of Ceylon Ltd	13C - 07		22.12.15	310	2	1	0	1409	11				2022.12.31	219,834		219,834
																987,864
එකතුව																1,645,795

ආරක්ෂිත යනු අදාළ ශීර්ෂය විෂයය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වන්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගිණුම් විෂයය තුළදී ඒ සඳහා අදාළ පාර්ශ්වයන්ට ගෙවීම් සිදුකර නොමැති ගනුදෙනුය.

බැරිවී යනු අදාළ ශීර්ෂ විෂයය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අදාළ වන්කම් හෝ සේවා ආයතනය වෙත ලැබී නොමැති, එහෙත් එකී භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ අරමුණින් බාහිර පාර්ශ්වයන් සමඟ එළඹ ඇති ගිවිසුම් හෝ ලිඛිත එකඟතාවයන්ය.

.....
~~ප්‍රධාන ගිණුම්කරණ නිලධාරී~~/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූල්‍ය) /කොමසාරිස් (මූල්‍ය)
දිනය :

ඩබ්ලිව්.එච්.සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලං.ඉ.සේ. - 1
රජයේ කර්මාන්ත දෙපාර්තමේන්තුව
කොළොන්නාව

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)

මූ.ගෙ.94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 310
වැඩසටහන් අංකය හා නාමය: 02, සංවර්ධන වැඩසටහන්

බැඳීම් ලාභියාගේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	වටිනාකම් (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු						
නැත						
නැත						
එකතුව						
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල						
නැත	——→	නැත	←——	——		
එකතුව						
3. වෙනත් (අපෞද්ගලික අංශය)						
නැත						
නැත						
එකතුව						
මුළු එකතුව						

.....
~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ප්‍රධාන ගණකාධිකාරි/
~~අධ්‍යක්ෂ (මුදල්) /සෞඛ්‍ය සේවා (මුදල්)~~
දිනය : 2023/02/23

ඩබ්ලිව්.එච්.සී. ගිමාලි
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලං.ශා.සේ. - 1
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
කොළොන්නාව

ඇමුණුම-(V)

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (ii)

මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 310

වැඩසටහන් අංකය හා නාමය: 02, සංවර්ධන වැඩසටහන්

ණයකිම්යාගේ/ගෙවීම් ලාභියාගේ නම්* (ප්‍රතිපාදන මාරු කරන විට හඳුනාගෙන තිබිය යුතුය)	වගකීම් පිළිබඳ විස්තරය	ණයවර ලිපි අංක ආදිය	ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද				මාරුකරන ලද මුදල රු.
			ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු එකතුව							
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල එකතුව			නැත				
3. වෙනත් (පෞද්ගලික අංශය)							

.....

~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ ප්‍රධාන ගණකාධිකාරි/
~~අධ්‍යක්ෂ (මුදල්)~~ /~~කොමසාරිස් (මුදල්)~~

දිනය : 2022/07/27

ඩබ්ලිව්.එච්.සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලං.ග.සේ. 1
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
කොළඹ 10

ඇමුණුම -(vi)

ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 02, සංවර්ධන වැඩසටහන්

රු.

(1) ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන්කිරීම්ද ඇතුළුව 2022 ඇස්තමේන්තුගත වෙන්කිරීම්

(2) ඉහත (1) ට අදාළ 2022 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම

(3) 2022 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව

(4) 2021 හා ඊට පෙර වර්ෂවලට අදාළව, 2022 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (ඇන්නම්)

(5) 2022 වර්ෂය සම්බන්ධයෙන් 2022 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව

(6) 2021 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම්පෑම් සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව

(7) 2022 වර්ෂය සම්බන්ධයෙන් 2022 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව

(8) 2021 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2022 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව

(9) 2022 වර්ෂය වෙනුවෙන් 2022 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව

(10) 2022 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව
{[(3+4+5) - (6+7) -]8+9)]

(11) විසර්ජන ගිණුම් පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2022 වර්ෂය සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව

(12) විසර්ජන ගිණුම් පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2022 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව

(13) විසර්ජන ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව
(10 + 11 - 12)

නැත

.....
~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~ ප්‍රධාන ගණකාධිකාරි/
~~අතිරේක (මූල්‍ය) /කොමිසාරිස් (මූල්‍ය)~~
දිනය : 2023/02/23

ඩබ්ලිව්.එච්.සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලං.ග.සේ. 1
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
කොළඹ 07

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය

රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 310

වැඩසටහන් අංකය හා නාමය: 02, සංවර්ධන වැඩසටහන්

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
		← නැත →		

.....

~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ ප්‍රධාන ගණකාධිකාරි/
~~අධ්‍යක්ෂ (මුදල්) / අකාම්සාසිස් (මුදල්)~~
දිනය : 2023/02/23

ඩබ්ලිව්.එච්.සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලං.ඉ.සේ. 1
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
කොළොන්නාව.

ඇමුණුම-(viii)

2007/09/05 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2007/05 හි (1) වැනි ඡේදයේ උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද නව බැංකු ගිණුම් පිළිබඳ 2022.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම් ශීර්ෂ අංකය: 310 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

බැංකුවේ නම	ගිණුම් අංකය	2022/12/31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2022.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2022.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්) රු.	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
ලංකා බැංකුව	7042729	24,275,297	-	167,145	2022 දෙසැම්බර්
ලංකා බැංකුව	7042705	16,894.744	-	-	2022 දෙසැම්බර්

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට නහවුරු කරමි.

.....

~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :

ඩබ්ලිව්.එච්.සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරි
ඊ ළ.ශ.සේ. - 1
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
කොළඹ-10

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය රු.000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.01.01 R	රජයේ ගොඩනැගිල්ලක කුලිය	7000	6800	5666	83%
2002.02.09	වෙනත්	-	1000	1217	121%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය රු.000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන	149 630	149 630	143 710	96%
ප්‍රාග්ධන	50 800	50 800	31 572	63%

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය රු.000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය රු.000
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	ස්ථාවර වත්කම් සමීක්ෂණය යටතේ ඉහත අයිතම වල සමීක්ෂණ කටයුතු සිද්ධ් කිරීමට ප්‍රතිපාදන නොමැති නිසා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂයන් ලබා දිය නොහැක.	408 971
9152	යන්ත්‍රෝපකරණ		285 879
	වාහන		72 379
9153	ඉඩම්		240 000
9160	WIP		-

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය - 309 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය

ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන

ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොනිබුණි.

	වාර්ෂික කළමනාකරණ විගණන වාර්තාව ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
(අ)	1.2.1 (ඇ)	**ගබඩා අත්තිකාරම් ගිණුම් - 2021** විගණන ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයේ නිකුත් කළ තොගයේ පිරිවැය රු. 160,397,852 ක් විය. නමුත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව තොග නිකුත් කිරීමේ අගය රු. 159,042,692ක් වූයෙන් සමාලෝචිත	නිකුත් කළ තොගය නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතුවේ.

වර්ෂයේ තොග නිකුත් කිරීමේ පිරිවැය රු.1,355,160 ක් අඩුවෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

1.6 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1. ආදායම් නොවන ලැබීම්

(අ) අත්තිකාරම් ගිණුම්

(i) මූල්‍ය ප්‍රකාශනයේ ACA -5 ආකෘතියෙහි රජයේ නිලධාරීන්ට අත්තිකාරම් යටතේ මුදලින් අත්තිකාරම් ලැබීම රු. 39,800 ක් වූ අතර SA- 52 භාණ්ඩාගාර ආකෘතියෙහි මුදලින් ලැබීම් වටිනාකම රු. 18,672,188 ක් විය. එම නිසා මුදලින් අත්තිකාරම් ලැබීම ආකෘති දෙක අතර රු .18,632,388 ක විචලතාවයක් පවතින බව නිරීක්ෂණය විය.තවද මූල්‍ය ප්‍රකාශනයේ ACA – 5 ආකෘතියෙහි රජයේ නිලධාරීන්ට අත්තිකාරම් යටතේ හරස් සටහන් මගින් බැර වීම රු. 20,688,652 ක් වූ අතර SA -52 භාණ්ඩාගාර ආකෘතියෙහි හරස් සටහන් මගින් බැර වීම රු. 2,056,264 ක් වීමෙන් රු. 18,632,388 ක විචලතාවයක් නිරීක්ෂණය විය. මේ අනුව ACA-5 සහ, SA – 52 යන ආකෘති අතර මුදලින් හා හරස් සටහන් මගින් ලැබීම් අතර රු.18,632,388 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) මූල්‍ය ප්‍රකාශනයෙහි ACA- 5 ආකෘතියෙහි රජයේ නිලධාරීන්ට අත්තිකාරම් යටතේ මුදලින් අත්තිකාරම් ගෙවීම් රු.5,450 ක් වූ අතර SA-52 භාණ්ඩාගාර ආකෘතියෙහි එම අගය රු.2,944,250 ක් විය. තවද ACA-5 ආකෘතියෙහි රජයේ නිලධාරීන්ට අත්තිකාරම් යටතේ හරස් සටහන් මගින් අත්තිකාරම් ගෙවීම් රු. 5,770,437 ක් වූ අතර SA- 52 භාණ්ඩාගාර ආකෘතියට අනුව ශේෂය රු. 2,831,637 ක් වූයෙන් රු. 2,938,800 ක වෙනසක් නිරීක්ෂණය විය. මේ අනුව ආකෘති දෙක අතර මුදලින් හා හරස් සටහන් මඟින් අත්තිකාරම් ගෙවීම් අතර රු. 2,938,800 බැගින් විචලතාවයන් නිරීක්ෂණය විය.

(ආ) ගබඩා අත්තිකාරම් ගිණුම්

(i) ගබඩා අත්තිකාරම් ගිණුමෙන් කලවැඩ අත්තිකාරම් ගිණුමට නිකුත්කල ද්‍රව්‍ය වල වටිනාකම කළ වැඩ අත්තිකාරම් ගිණුමේ රු. 204,588,585 ක් ලෙස දක්වා තිබුණද ගබඩා අත්තිකාරම් ගිණුමෙහි නිකුත් කිරීම් වටිනාකම රු. 204,647,488 ක් ලෙස දක්වා තිබීමෙන් මෙම ගිණුම් දෙක අතර රු. 58,904 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) පිරිවැයට සියයට 10 ක අගයක් එකතු කර ගබඩා ද්‍රව්‍ය නිකුත් කළ යුතු අතර ඒ අනුව සමාලෝචිත වර්ෂයේ නිකුත් කළ තොගයේ වටිනාකම රු182,558,190 ක් විය යුතු වේ. නමුත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව තොග නිකුත් කිරීමේ පිරිවැය රු.174,236,395 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ තොග නිකුත් කිරීමේ වටිනාකම රු. 8,321,795 ක් අඩුවෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

(i) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3.2 වගන්තිය ප්‍රකාරව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අය විය යුතුව ඇති ණය ශේෂය අදාල ස්ථාන මාරු වී ගිය කාර්යාලයෙන් එක්වර අයකරගත යුතු වුවද 2016.04.11 දින කොළඹ මහ නගර සභාවට මාරු වී ගිය නිලධාරියෙකුගෙන් වසර 05 කට වැඩි කාලයක් තුළ අයවිය යුතුව තිබූ රු. 138,300 ක ආපදා ණය ශේෂය, 2022 ජනවාරි මස සිට වාරික වශයෙන් අයවෙමින් පැවතුනද 2022 අගෝස්තු මස සිට වාරික වශයෙන් හෝ අයකර ගැනීමට නොහැකි වී තිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ii) යම් නිලධාරියෙකු, ණය මුදලක් ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ලබා ගන්නේ නම් නිලධාරියාගේ පාරිතෝෂික මුදල් වලින් හෝ එසේ නොමැති නම් නිලධාරියාගේ මාසික විශ්‍රාම වැටුපෙන් හෝ අයකරගත යුතු වුවත් විශ්‍රාම ගිය නිලධාරීන් 13 දෙනෙකුගෙන් රු. 1,312,931 ක් මාස 03 අවුරුදු 05 අතර කාල පරාසයක සිට අයවීමට ඇති බව නිරීක්ෂණය විය.

(iii) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම අනුව 2022 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කරන ලද නිලධාරියෙකුගෙන් ලැබීමට ඇති ණය මුදල වූ රු. 145,650 ක මුදලක් වර්ෂ 05 ට වැඩි කාලයක් ගත වී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iv) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ තොරතුරු අනුව සේවය අතහැර ගිය නිලධාරීන් 11 දෙනෙකුගේ රු.573,080 ක් වූ ණය ශේෂ වර්ෂ 05ට වැඩි කාලයක් අය නොවී පවතින බව නිරීක්ෂණය වූ අතර වටිනාකම රු. 186,410 ක් වූ නිලධාරීන් 03 දෙනෙකුගේ ණය ශේෂ වසර 01 සිට 05 දක්වා කාලයක සිට අයකර ගැනීමට නොහැකි වී තිබුණු බවද විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) කළවැඩ අත්තිකාරම් ගිණුම

(i) 2018 වර්ෂයේ සිට පැවත එන ණයගැතියන්ගෙන් වැඩිපුර ලැබීම් ගිණුමෙහි ඇති රු. 16,891,719 ක් වූ ශේෂයෙන් 2009 වර්ෂයේ ණයගැතියන් වූ රු. 10,030,152 ක ශේෂයක් හිළව් කර තිබුණි. එසේ හිළව් කළ ශේෂය අදාළ වැඩිපුර ලද ණයගැතියාට අදාළ වූ ශේෂයක් නොවීය. ඒ අනුව 2018 වර්ෂයෙන් පසු ණයගැතියන්ගෙන් වැඩිපුර ලැබීම් ශේෂයෙන් 2009 වර්ෂයේ ඇති වූ ණයගැති ශේෂයන් කිසිදු පදනමක් නොමැතිව සාවද්‍ය ලෙස හිළව්කර තිබුණි.

(ii) 2008 හා 2009 වර්ෂවල ණයගැතියන්ගේ එකතුව රු. 36,941,553 ක් වූවද ලියාහැරීම සඳහා අනුමැතිය ලබාදුන් කමිටු වාර්තාව ප්‍රකාරව 2008 හා 2009 වර්ෂයන්හි ණයගැතියන්ගේ එකතුව රු. 4,045,992 ක් විය. එසේ තිබියදී මූල්‍ය ප්‍රකාශනයෙහි 2008 හා 2009 වර්ෂයන්හි ඉහත සඳහන් මුළු ශේෂයම කපාහැර තිබුණි.

1.6.2 තැන්පතු ගිණුම

වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් තුල නිරවුල් නොවූ ටෙන්ඩර් තැන්පතු ශේෂය රු.848,563 ක් වූ අතර එම ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි

1.6.3 මූල්‍ය නොවන වත්කම්

මූල්‍ය ප්‍රකාශනයෙහි ACA – 6 ආකෘතිය සහ SA - 82 භාණ්ඩාගාර ආකෘතීන්හි සඳහන් රු.284,896,200 ක වටිනාකමකින් යුත් කාර්යාල උපකරණ, ලී බඩු උපකරණ, පරිගණක උපකරණ, විද්‍යුත් උපකරණ හා කාර්මික හා නිෂ්පාදන උපකරණ භෞතිකව හඳුනා ගැනීමට හැකි වන පරිදි කේත අංක යොදා නොතිබුණි.

1.6.6 මූල්‍ය වත්කම් .

කළ වැඩ අත්තිකාරම් ගිණුමෙහි 2022.12.31 දිනට ණයගැති ශේෂය රු. 536,724,700 ක් වූ අතර වර්ෂ 01 ත් 10ත් අතර නිරවුල් නොවූ ණයගැති ශේෂය රු. 310,357,322 ක් වූ බැවින් ණයගැති ශේෂයන් නිරවුල් කර ගැනීම ඉතාමත් දුර්වල තත්ත්වයක විය.

1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන ගනුදෙනු හා ශේෂයන් සම්බන්ධයෙන් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

	අයිතමය	වටිනාකම රු.	සාක්ෂි නොවීම
	---	---	---
(අ)	ක්ෂය අරමුදලින් දැරූ වියදම්	1,682,924	විස්තරාත්මක උපලේඛන
(ආ)	2021 වර්ෂයේ දී ලියාහරින ලද ණයගැනියන්	53,161,909	අදාල අනුමැතීන්
(ඇ)	2012 සහ 2013 වර්ෂයන්හි මිලදී ගත් යන්ත්‍ර	16,467,739	විස්තරාත්මක උපලේඛන
(ඈ)	2012 සහ 2013 වර්ෂයන් හි මිලදී ගත් ලී බඩු	765,283	විස්තරාත්මක උපලේඛන

1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා තිබුණු නමුත් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
---	---	---
හානි පාඩු ලේඛනය	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන	අංක PD- 9101 දරන වාහනයේ 2021.11.29 දින සිදු වී තිබුණු අනතුර පිළිබඳ තොරතුරු ඇතුළත්ව නොතිබීම.
බැරකම් ලේඛනය	මුදල් රෙගුලාසි 445 හි විධිවිධාන	බැරකම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
පුද්ගල පඩිනඩි ලේඛනය	මුදල් රෙගුලාසි 453 හි විධිවිධාන	යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ රු. 1,191,508 ක් වටිනා බැරකම් ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

2.2 බැංකු ගිණුම්

දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන අංක 7042729 දරන බැංකු ගිණුමට අදාළව 2022 දෙසැම්බර් 31 දින වන විට රු. 167,145 ක වටිනාකමැති මාස 06 ට වැඩි ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.4 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 571	සෑම අර්ධ වර්ෂයක් අවසානයේ දී ඉකුත් වූ තැන්පතු පිළිබඳව ලැයිස්තුවක් පිළියෙළ කර නොතිබුණි.
(ආ)	2019 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය මූල්‍ය අංක 08/2019 දරන චක්‍රලේඛයේ 2.1 , 2.2, 2.3, 2.4, 2.5 වගන්ති	2020 ජනවාරි 31 දිනට පෙර ඉලෙක්ට්‍රොනික රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියෙහි ලියාපදිංචි වීම ඇතුලු කාර්යයන් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	2020 ඔක්තෝබර් 02 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය 05/2020 03 ඡේදය	අළුත්වැඩියා කළ වාහන පිළිබඳ තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා 2021 ජනවාරි 15 දිනට පෙර කොමිප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ)	අංක 01/2017 දරන 2017 ජූනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ	
	(i) 5 වන වගන්තිය	භාණ්ඩාගාර කොමිප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත ආයතනය සතු රු.72,379,000 ක වාහන හා රු.278,543,676 යන්ත්‍රෝපකරණ පිළිබඳව වාර්තා කර නොතිබුණි.
	(ii) 7 වන වගන්තිය	සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු. 7,335,911 ක් වටිනා සන්නිවේදන උපකරණ හා කාර්මික හා නිෂ්පාදන උපකරණ පිළිබඳව කොමිප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර නොතිබුණි.

(ඊ)	01/2020 දරණ 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය 13.2 වගන්තිය	2020 වර්ෂයේ සිට භාවිතයට ගත නොහැකි වූ අංක 41-9170 දරන රථය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.5. බලය නොලත් කාරක පාඩු

මූ.රෙ. 513 ප්‍රකාරව 2022 වර්ෂයේ කලවැඩ අත්තිකාරම් ගිණුමෙහි (31003) බලය නොලත් කාරක පාඩුව රු. 44,120,843 ක් විය.
මේ සම්බන්ධයෙන් 2022 නොවැම්බර් 30 දිනට පිළියෙල කරනු ලැබූ ලාභඅලාභ ගිණුම ප්‍රකාරව ශුද්ධ අලාභය රු. මිලියන 32ක් බවත් 2022 දෙසැම්බර් 31 දිනට අනුමාන කරන ලද අලාභය වෙනුවෙන් රු. මිලියන 150ක ප්‍රතිපාදන 310- 2-1-0-1701 වැය විෂයය වෙත සලසා දෙන මෙන් 2022 දෙසැම්බර් 16 දිනැති අංක 2C / සීමා සංශෝධන / 365/ 02/ (2022- 2025) යන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඇමතූ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) ගේ ලිපියෙන් ඉල්ලුම් කර තිබුණද 2022 මැයි 19 වන දින දක්වා කාරක පාඩු පියවා ගැනීම සඳහා එම ප්‍රතිපාදන සැලසී නොතිබුණු බව නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

(අ) නැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා නාවකාලික ගොඩනැගිල්ලක් ඉදි කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද රු.104,412,899ක්වූ ඇස්තමේන්තුගත පිරිවැයකට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නැපැල් දෙපාර්තමේන්තුව එකඟවී 2020 මාර්තු 06 දින අත්තිකාරම් වශයෙන් රු.22,199,572ක් දෙපාර්තමේන්තුවට ලැබී තිබුණි. එසේ වුවද ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සියයට 10 ක් පමණක් විය.

(ආ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඇල්ලේවැව දිය දොරටු ඉදිකර සවි කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ඉලක්කගත ප්‍රතිපාදන රු. 14,178,200 ක් වූ අතර භෞතික ප්‍රගතිය සියයට 5 ක් පමණක් විය.

(ඇ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ උෟව කුඩා ඔය ජලාශය සඳහා දිය දොරටු සවි කිරීම සඳහා වූ රු. 12,708,000 ක් වූ ඇස්තමේන්තුගත වටිනාකමකින් යුත් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 20ක් පමණක් විය.

(ඇ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දිසවාපි ස්ථූපය සඳහා ආකෘතියක් සකස් කිරීමේ රු. 4,147,400 ක් වූ ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත ව්‍යාපෘතිය සියයට 5ක භෞතික ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණි.

3.1.2 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

(අ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ විදුලි ලාම්පු කණු 191 ක් සැපයීමේ රු. 32,391,346 ක් වටිනා ව්‍යාපෘතිය නවතා දමා තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට රු. 2,707,512 ක් වටිනා විදුලි ලාම්පු කණු 17 ක් පමණක් නිමකර තිබූ බැවින් භෞතික ප්‍රගතිය සියයට 9 ක් විය. ව්‍යාපෘතිය වෙනුවෙන් ඉදි කරන ලද චීනවට්ටි පහන් කණු කොටස්, වීදුරු කේස් හා ඇලුමිනියම් කොටස් යනාදි ඉතිරි වී ඇති උපාංග වැඩහල 01 සහ වැඩහල අංක 06 හි නිෂ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ Adjustable beds 20ක් සෑදීමේ රු.400,000ක් වටිනා ව්‍යාපෘතිය මුළුමනින්ම ඉටු නොකර තිබුණි.

(ඇ) ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයේ බද්දේගම ජලසම්පාදන පද්ධතිය පිළියෙල කිරීමේ රු.159,024,118ක ව්‍යාපෘතිය ඉටු කර නොනිබුණි.

(ඈ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ යකඩ පාලම පිළිසකර කිරීමේ රු.53,463,000ක් වටිනා ව්‍යාපෘතිය නවතා දමා තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 37ක් පාවිච්චි නොකර ඌන උපයෝජිතව පැවතුණු අතර රූඩ් 01 පර්චස් 08.87ක බිම් ප්‍රමාණයක පිහිටි බැරල් මඩුවද නිශ්කාර්යව පැවතුණි.

(ආ) මායිම් තාප්ප හෝ ස්ථිර වැටක් යොදා දෙපාර්තමේන්තුව සතු ඉඩම් ආරක්ෂා කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් රජයේ කර්මාන්තශාලා සේවක නිවාස පිහිටි ඉඩමේ ඌන උපයෝජිතව පවතින ඉතිරි අක්කර 01 යි රූඩ් 03 යි පර්චස් 11ක භූමි භාගය අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන තිබුණි.

(ඇ) රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පිහිටි ඉඩමද ඇතුළුව දෙපාර්තමේන්තුව සතු එකතුව අක්කර 24 රූඩ් 01 පර්චස් 1.87 ක් වූ ඉඩම් තුනක් වෙනුවෙන් ඔප්පු දෙපාර්තමේන්තුව සතුව නොමැති අතර මිනින්දෝරු සැලැස්ම පදනම්කරගෙන ප්‍රාදේශීය ලේකම් මහින් අයිතිය තහවුරු කරගැනීමට කටයුතු කර නොනිබුණි.

(ඉ) ගබඩා අත්තිකාරම් ගිණුම් යටතේ වූ තොග සත්‍යාපන වාර්තා පිළිබඳ සිදු කල නියැදි පරීක්ෂණයට අනුව C අංශයේ ගබඩාවෙහි රු. 2,689,162 ක් වටිනා අයිතම 285 ක්, I අංශයේ ගබඩාවෙහි රු. 24,591,684 ක් වටිනා අයිතම 166 ක් සහ A අංශයේ රු. 16,964,968 ක් වටිනා අයිතම 281 ක් සැලකිය යුතු කාලයක් නිකුත් නොවී පවත්වාගෙන යාම තුළින් වාර්ෂිකව මේ සඳහා නඩත්තු පිරිවැයක් දැරීමටත්, ගබඩාවල ඉඩකඩ ඇහිරීමත්, තොග පරීක්ෂණය වෙනුවෙන් ශ්‍රමය හා කාලය අනවශ්‍ය ලෙස වැය වීමත්, තොග යල් පැනීම හේතුවෙන් ඒවායේ වටිනාකම් අඩුවීමත් නිරීක්ෂණය විය.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

2022 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රුපියල් මිලියන 97ක් වැය කර තිබුණි. ඒ අනුව එකපුද්ගල වියදම රු.257,030ක් වී තිබුණි.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	31	18	15
තෘතියික මට්ටම	10	02	08
ද්විතියික මට්ටම	282	149	134
ප්‍රාථමික මට්ටම	446	180	266
වෙනත්	-	-	-
එකතුව	**769**	**349**	**423**

තනතුරු 423 ක පුරප්පාඩු පවතින අතර කාර්ය ප්‍රමාණය මත සේවකයින් බඳවා ගැනීමට හෝ අවශ්‍යතාවයන්ට අනුව තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

එච්.ඒ.ඩී.වාන්දනී
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
කළ වැඩ අත්තිකාරම්	√		
ප්‍රාග්ධන වියදම්			√

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
පිරිසුදු ජලය හා සනීපාරක්ෂාව	100%				√
පුනර්ජනනීය බල ශක්තිය භාවිතය	100%		√		
LED විදුලි ලාම්පු භාවිතය	100%			√	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- විදුලි හා ජල විගණනය සඳහා ගොඩනැගිලි / වැඩහල් සඳහා ජල මීටර්/ විදුලි මීටර් සවි කිරීම.
- Mercury (රසදිය) බල්බ හා CFL බල්බ භාවිතය හා මිල දී ගැනීම අවම කරමින් LED බල්බ/ සූර්ය පැනල භාවිතය දිරිගැන්වීම.
- කසළ කළමණාකරනය.
- දිවා කාලයේදී ආලෝකමත් කිරීමට හැකිතාක් සූර්යාලෝකය භාවිතා කිරීම.
- හරිත ගොඩනැගිලි සංකල්පය සඳහා සූදානම් වීම.
- තාප්පය වටා සහ ඇතුලත සූර්ය බලශක්ති විදුලි ලාම්පු සවි කිරීමට කටයුතු කරමින් පවතී.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	31	18	15
තෘතියික	10	02	08
ද්විතියික	282	149	133
ප්‍රාථමික	446	180	266
එකතුව	**769**	**349**	**422**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය / අතිරික්තයේ බලපෑම

- ප්‍රාථමික ශ්‍රේණිවල කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 446 ක් වන අතර 266 ක පුරප්පාඩු සංඛ්‍යාවක් පවතී.
- විධායක හා ද්විතික ශ්‍රේණිවල නිලධාරී ඌණතාවය හේතුවෙන් විෂයන් කීපයක් භාර දී ඇත. එහිදී ඒ ඒ කාර්යයන්හි කාර්යක්ෂමතාවයට බලපෑම් සිදු වී ඇත.
- එකවර ව්‍යාපෘති කීහිපයක කටයුතු කිරීමට සිදුවීමේදී, කාර්ය මණ්ඩල ඌනතාවය, මහත් බලපෑම් ඇති කරයි.
- පවත්නා නිෂ්පාදන කාර්යයන්ට හා ප්‍රාථමික ශ්‍රේණිවල නිලධාරීන්ට වැටුප් හ වේතන ගෙවනු ලබන්නේ දෙපාර්තමේන්තු කළ වැඩ අත්තිකාරම් ගිණුමෙන් වන බැවින් එම මූල්‍ය ශක්තිය ද සලකා බලා බඳවා ගැනීම් කරනු ලැබේ.

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වූ ආකාරය 2022

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)	පුහුණු කිරීම් වර්ගය (දේශීය,විදේශීය)	පුහුණුවෙන් පසු ලබා ගත් දැනුම
1.	වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය	188	දින 08	0.00	දේශීය	සතුටුදායකයි
2.	ඵලදායීතාවය හා වැඩහල් කළමනාකරනය	252	දින 07	0.00	දේශීය	සතුටුදායකයි
3.	ආරක්ෂාව	28	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
4.	Ms. Excel	22	දින 02	0.00	දේශීය	සතුටුදායකයි
5.	විදුලිය	67	දින 02	0.00	දේශීය	සතුටුදායකයි
6.	කාර්මික සාමය හා ආර්ථික සමෘද්ධිය	69	දින 03	0.00	දේශීය	සතුටුදායකයි
7.	ලීන් සංකල්පය - නාස්තිය	80	දින 03	0.00	දේශීය	සතුටුදායකයි
8.	නිවාඩු	5	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
9.	NITA – NVQ පිළිබඳ	18	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
10.	CNC	118	දින 03	0.00	දේශීය	සතුටුදායකයි
11.	කම්කරු ප්‍රඥප්තිය	08	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
12	විදුලිය අරපිරිමැස්ම	49	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
13	මිණුම් උපකරණ භාවිතය	41	දින 02	0.00	දේශීය	සතුටුදායකයි
14	නිවාඩු විධිමත්ව පවත්වාගන යාම	45	දින01	0.00	දේශීය	සතුටුදායකයි
15	මූලික කාර්යයන් හා නීති රෙගුලාසි	11	දින 01	0.00	දේශීය	සතුටුදායකයි

2022 වර්ෂය සඳහා පුහුණු වැඩසටහන් වෙනුවෙන් වෙන්කර දෙන ලද ප්‍රතිපාදන මුදල සීමාසහිත වූ බැවින් ආයතනය තුලින් සම්පත් දායකයන් යොදාගනිමින් ඉහත සඳහන් පරිදි කාර්යමණ්ඩලය පුහුණු කිරීම සිදු කරන ලදි.එමෙන්ම ,

වැය ශීර්ෂ 310-2-1-02401 යටතේ කාර්ය මණ්ඩල පුහුණු සඳහා ලක්ෂ 3ක මුදලක් අනුමත වී තිබුණි. 2022 වර්ෂය අවසානවන විට වෙන්කල මුදල 100% වැය වන පරිදි අදාල පුහුණු කටයුතු සිදු කර ඇත.එය පහත සඳහන් පරිදි වේ.

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)	පුහුණු කිරීම් වර්ගය (දේශිය,විදේශිය)	පුහුණුවෙන් පසු ලබා ගත් දැනුම
1.	ශ්‍රී ලංකා පරමාණුබලශක්ති අධිකාරිය	01	දින 02	58320.00	දේශිය	සතුටුදායකයි
2.	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය	02	දින 02	64000.00	දේශිය	සතුටුදායකයි
3.	ශ්‍රී ලංකා පදනම් ආයතනය	08	පැය 16	64000.00	දේශිය	සතුටුදායකයි
4.	ශ්‍රී ලංකා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය	08	පැය 16	63125.00	දේශිය	සතුටුදායකයි
5.	ශ්‍රී ලංකා පරමාණුබලශක්ති අධිකාරිය	01	දින 02	50120.00	දේශිය	සතුටුදායකයි

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල වේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.9	භාණ්ඩ පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍ර ලේඛ 1-2019ට වැඩිමනක් වශයෙන් DMA/AMC/M/2021/2 හා 2021/08/06 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් ලිපිය අනුව රැස්වීම් පැවැත්වීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		

09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව, කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරවකටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
අංකය	**අදාළ කර ගත යුතු අවස්ථාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනකූල වීම	අනුකූල වේ.		
12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.		2020 වර්ෂයේ සිට සෑම මසකම ශේෂයන් පරීක්ෂා කර ඒවා පියවා ගැනීමට කටයුතු කරනු ඇත.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳීම් කිරීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15	**අදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD වක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ.		
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම , ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධන කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

7.1 අභ්‍යන්තර විගණක වාර්තාව

දැක්ම :

යාන්ත්‍රික ඉංජිනේරු නිෂ්පාදන සහිත දෙපාර්තමේන්තුවක මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය විනයෙන් යුත් ඉදිරි ගමනක් සඳහා විගණනය මඟින් අත්වැලක් සැපයීම.

අරමුණු :

දෙපාර්තමේන්තුවේ පවතින මූල්‍ය සම්පත් , මානව සම්පත් ඇතුළු අනෙකුත් අර්ථික සම්පත් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායිතාවයෙන් යුක්තව මෙන්ම පවතින රාජ්‍ය නීති රීති හා උපදෙස් ප්‍රකාරව දෙපාර්තමේන්තු අරමුණු සඳහා යොදවා ගන්නේද යන්න පිළිබඳව සොයා බලා දෙපාර්තමේන්තු ප්‍රධානි වෙත හා අනෙකුත් සම්බන්ධිත විගණන පාර්ශවයන් වෙත වාර්තා කිරීම.

<u>රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරය හා වාර්ෂික ප්‍රගතිය - 2021 වර්ෂය.</u>

අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන කාර්යයන් :

- දෙපාර්තමේන්තුවේ එකිනෙක අංශවල විගණන කටයුතු සිදු කිරීම තුළින් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම හා එමඟින් පවතින ගැටළු අවම කිරීමට කටයුතු කිරීම.
- හදිසි විමර්ශනමය කාර්යයන් ඉටු කිරීම.
- මුදල් අමාත්‍යාංශයේ විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කාර්යයන්
- රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණන අංශය හා රජයේ විගණන අංශය සමඟ සම්බන්ධීකරණ කාර්යයන් සිදු කිරීම.

2022 වාර්ෂික ප්‍රගතිය :

2022 වර්ෂයේ විගණන සැලැස්ම අනුව විගණන වැඩසටහන් 12 ක් සැලසුම් කර තිබුණ ද වර්ෂය තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසාවෙන් විගණන සැලැස්ම සංශෝධනය කර මුල් සැලසුමේ නොමැති විගණන කිහිපයක්ද සහිතව විගණන වාර්තා 12 ක් නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

01. **නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා - 2022**

2022 වර්ෂයේ විගණන සැලැස්ම අනුව විගණන වැඩසටහන් 12 සැලසුම් කර තිබුණද අභ්‍යන්තර විගණන සැලැස්ම සංශෝධනය කරමින් අනු අංක 07 වාර්ෂික බඩුතොග ගබඩා සමීක්ෂණ කටයුතු විගණනය වෙනුවට වැඩහල අංශයේ සේවක නිවාඩු විගණනයට ඇතුලත් කර වර්ෂය තුල විගණන වාර්තා 12 ක් නිකුත් කිරීමට කටයුතු කන ලදි.

02. **දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම - 2022 වර්ෂය**

2022 වර්ෂයේ සැලසුම් කරන ලද විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 4 ම අදාල වර්ෂයේ පැවැත්වීමට හැකි විය.

කාර්තුව	පැවැත්වූ දිනය
පළමු කාර්තුව	2022.02.22
දෙවන කාර්තුව	2022.06.09
තෙවන කාර්තුව	2022.08.30
සිව්වන කාර්තුව	2022.11.29

03. **කාර්තුමය ඇගයීම් වාර්තා ඉදිරිපත් කිරීම - 2022වර්ෂය.**

කාර්තුව	දිනය
2021/04	2022.01.11
2022/01	2022.05.05
2022/02	2022.08.03
2022/03	2022.10.19

04. **රේඛීය අමාත්‍යාංශ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් සාකච්ඡා සටහන් ප්‍රගතියට අදාළ ආකෘතිමය තොරතුරු ඉදිරිපත් කිරීම - 2022 වර්ෂය**

දිනය
2022.03.09
2022.08.23
2022.10.19
2022.12.02

05. <u>වෙනත්</u>

අභ්‍යන්තර විගණන ඒකකය විසින් ඉහත දක්වා ඇති විගණන වාර්තා නිකුත් කර ඇත. ඒ සම්බන්ධයෙන් අඛණ්ඩව පසු විපරම් සිදු කරන අතර අදාළ පාර්ශව වෙතින් ලබාගත් පිළිතුරු ද විශ්ලේෂණය කරමින් අවශ්‍ය නිවැරදි කිරීම් හා මඟ පෙන්වීම් සිදු කර ඇත.

මීට අමතරව විගණන කළමනාකරණ කමිටු රැස්වීම් තුලින් පුරප්පාඩු හා බඳවාගැනීම්, අත්තිකාරම් බිම් ගිණුමේ ණය ශේෂ, කළවැඩ අත්තිකාරම් ගිණුමේ ණය ගැති ශේෂ හා රජයේ නිවාස , දෙපාර්තමේන්තු පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්වල ප්‍රගතිය , ගබඩා සමීක්ෂණ කාර්යයන් , දෙපාර්තමේන්තු ණය හිමියන්, අභ්‍යන්තර හා රජයේ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමේ ප්‍රගතිය , යනාදිය සම්බන්ධයෙන් අවධාරණය කරමින් අවශ්‍ය මඟ පෙන්වීම් සිදු කිරීමට කටයුතු කර ඇත.



රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව





